## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2019

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතු කල අගය මත බදු ගිණුමේ ලැබිය යුතු ශේෂය ලෙස රු.104,676,878 ක් 2012 වර්ෂයේ සිටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද අංක TIN 409015026-7000 යටතේ බදු ආදායමට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එවා ඇති 2020 පෙබරවාරි 17 දිනැති ලිපිය ප්‍රකාරව මණ්ඩලයට ගෙවිය යුතු කිසිදු ශේෂයක් නොමැති බව දන්වා එවා තිබූ නමුත් මණ්ඩලය විසින් එම ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | TIN 409015026-7000 බදු අංකයට අදාළ ව අපනයන මණ්ඩලයට ගෙවිය යුතු කිසිදු ශේෂයක් නොමැති බව තහවුරු කරමින් ලිපියක් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2020.02.17දින දී අප වෙත නිකුත් කරන ලදී .එය විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු කිරිමට අපේක්ෂා කරමු . | එම ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඌව පළාත් කෘෂි අපනයන කලාපයෙන් ලැබිය යුතු ශේෂයක් වන රු.10,403,683 ක් 2009 වර්ෂයේ සිටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදීද ණය ලබා ගත් පුද්ගලයන් හඳුනාගෙන තිබූ නමුත් ලැබිය යුතු ශේෂයන් තහවුරු කර ගැනීමට හා අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි ශේෂය සැසඳීම සඳහා පැරණි ලෙජර් වාර්තා හා වවුචර පරික්ෂා කරමින් පවතියි. | පියවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ)වෙනත් ණයගැතියන් තුළ ඇතුළත් එකතුව රු.9,468,431 ක් වූ ණය ශේෂ 11 ක් මාස 06 ඉක්මවා ඇතත් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පවතින උපචිත වියදම් ශේෂය රු.78,877,848 ක් වූ අතර ඒ තුළ එකතුව රු.1,272,629 ක 2017 හා 2018 වර්ෂවලට අදාළව ගෙවිය යුතු වියදම්ද ඇතුළත්ව තිබුණි. | එකතුව රු.772,629 ක් වූ ගෙවීම් සඳහා අවශ්‍ය ඉන්වොයිසි හා අනුමත කිරීම් නොලැබීම හේතුවෙන් පමා වුවද එම වර්ෂයන්ට අදාළ වියදම් වන අතර 2020 ගිණුම් වල දී අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබන අතර 2018 දී රු.500,000 ක ගෙවීම් චෙක්පත නිකුත් කල අතර එය අදාළ සමාගම විසින් රැගෙන නොගිය බැවින් කල් ඉකුත් වූ චෙක්පත අවලංගු කර ප්‍රතිපාදන ලෙස වෙන්කර ඇත. | ප්‍රතිපාදන ඇති විටක ගෙවීම් ප්‍රමාද නොකර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 395 | 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු.263,078 ක් වූ 2017 හා 2018 වර්ෂවලට අයත් හඳුනා නොගත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මෙම රු 263,078 .ක හඳුනා නොගත් තැන්පතු සම්බන්ධයෙන් බැංකුව හා අදාළ අංශ වෙතින් විමසීම් සිදුකිරීමෙන් පසු ආදායම් ගිණුම් වලට බැර කරනු ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 396 | 2019 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් සඳහා නිකුත් කරන ලද මාස 06 ඉක්ම වූ අගරු වූ රු.900,000 ක චෙක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම චෙක්පත් දෙක අත්සන් සඳහා යොමුකල පසු ඉල්ලා සිටි පැහැදිලි කිරීම් නිරවුල් කිරීමෙන් පසු , දින දීර්ඝ කර නැවත නිකුත් කිරීමේ අපේක්ෂාවෙන් රඳවා ගන්නා ලදී . | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.66,745,210 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.99,415,402 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.166,160,612 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආශ්‍රිත සමාගමේ කර තිබූ ආයෝජනයෙන් ලද රු.55,333,427 ක ලාභය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) මණ්ඩලයේ ආශ්‍රිත සමාගමක් වන DHPL සමාගමේ ආයෝජනයෙන් ලද ලාභ කොටස ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 160 කින් වර්ධනය වී තිබුණි.

(ආ) මණ්ඩලයේ අපනයන සංවර්ධන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 21 කින් අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දින වනවිට වසා දමනු ලැබූ සහ අක්‍රීය තත්වයේ පවතින සමාගම් 29 ක වරණීය කොටස්වල සිදුකර තිබූ ආයෝජන වටිනාකම රු.105,117,477 කි. එම සමාගම් සොයා ගැනීමට නොහැකිවීමෙන් නීතිමය පියවර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙහි සඳහන් බොහොමයක් සමාගම් අක්‍රීය තත්වයේ පවතියි. නීතිපති දෙපාර්තමේන්තුවෙන් දෙනලද උපදෙස් ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කරන ලදී. ඒ අනුව සමාගම් පනතේ 487(5) වගන්තියේ සඳහන් පරිදි අක්‍රීය සමාගම්වල වත්කම් සහ බැරකම් රාජසන්තක වන අතර ඒ අනුව අක්‍රීය සමාගම්වල වත්කම් හා බැරකම් රාජසන්තක වී ඇත්දැයි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර ඇත. | අක්‍රීය තත්වයේ පවතින සමාගම්වල වත්කම් හා බැරකම්වල තත්වය කඩිනමින් සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට සමාගම් 33 ක සාමාන්‍ය කොටස්වල ආයෝජනය කර තිබූ මුදල රු.58,312,483 ක් වේ. ඉන් සමාගම් 31 ක් ලාභ නොලබමින් හා අක්‍රීයව පැවති අතර එම සමාගම්වල වත්කම් හා බැරකම් රාජසන්තක කර තිබේදැයි සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් මණ්ඩලය විසින් විමසීම්කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ සමාගම් 2 කින් පමණක් ලාභාංශ ලෙස රු.193,538 ක් ලැබී තිබුණි. ඒ අනුව මුළු ආයෝජනයට ප්‍රතිලාභ අනුපාතය සියයට 0.4 ක් වැනි ඉතා අඩු අගයක පැවතුණි. | මෙහි සඳහන් බොහොමයක් සමාගම් අක්‍රීය තත්ත්වයේ පවති. ක්‍රියාත්මක තත්ත්වයේ පවතින සමාගම්වලින් ලාභාංශ ලැබී ඇත. | අක්‍රීය සමාගම්වල වත්කම් හා බැරකම් පිළිබඳ සොයාබලා කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ)ශ්‍රී ලංකා එක්ස්පෝ මැනේජ්මන්ට් පුද්ගලික සමාගම ස්වෙච්ඡාවෙන් ගනන් බේරා වසා දමා ඇති අතර සමාගම් ලියාපදිංචි නාම ලේඛනයෙන් 2010.01.22 දින | ශ්‍රී ලංකා එක්ස්පෝ මැනේජ්මන්ට් පුද්ගලික සමාගමේ ආයෝජන වටිනාකම සඳහා දැනටමත් පූර්ණ වශයෙන් හානිකරණ | අදාල අනුමැතිය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සමාගමේ නම කපා ඉවත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 10 ක් ගත වුවද එහි සාමාන්‍ය කොටස්වල ආයෝජිත මුදල වන රු.1,980,130 ක් සඳහා හානිකරණ වෙන් කිරීම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර තිබූ අතර එම අගය පොත්වලින් ලියා හැරීමට කටයුතු කර නොතිබුණි. | සඳහා වෙන්කිරීම් කර ඇත. අදාළ අනුමැතිය ලබාගත් පසු පොත්වලින් ලියා හැරීමට බලාපොරොත්තු වේ. | |
| (ඇ) 1980, 1990 යන වර්ෂ වලදී ණය යෝජනා ක්‍රමයකින් අපනයනකරුවන්ට ලබා දුන් ණය මුදලෙන් 2019 දෙසැම්බර් 31 දිනට පැවති ලැබිය යුතු ණය ශේෂය රු.40,262,508 ක් වූ අතර වර්ෂය තුළ මණ්ඩලය විසින් අයකරගෙන තිබුණේ රු.538,993 ක් පමණි. එය වර්ෂය අරම්භයේ පැවති ණය ශේෂයෙන් සියයට 1.32 ක් වැනි ප්‍රතිශතයකි. මේ අනුව මණ්ඩලය විසින් අපනයන ණය අය කර ගැනීම දුර්වල තත්වයක පවතින බව නිරීක්ෂණය කෙරේ. | ණයදුන් සමාගම් බොහොමයක් වසා දමා හෝ අක්‍රිය තත්වයක පවතියි. බොහෝ ලිපිනයන්හි එවැනි සමාගම් සොයා ගැනීමට නොහැකි වීමෙන් නීතිමය පියවර ගැනීමට නොහැකි වී ඇත. එබැවින් දැනට ක්‍රියාත්මක සමාගම්වලට එරෙහිව නඩු ගොනුකර හෝ සෘජු සම්බන්ධතා හරහා වාරික මගින් අයකරගත් මුදල් මෙම වර්ෂය තුළ පියවාගැනීම් ලෙස දැක්වේ. | කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ)දේශීය හා විදේශීය පුහුණු, වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගි කරවීමේදී නිලධාරීන්ට අපක්ෂපාතීව නිසි අවස්ථාව ලබා නොදීමෙන් වසරක් තුළදී එකම නිලධාරියාට අවස්ථා කිහිපයක්ද, වසර කිහිපයක් ගතවුවද පුහුණු සඳහා අවස්ථාවන් නොලැබුණු නිලධාරීන්ද සිටීම නිසා පුහුණුවීම සඳහා ක්‍රමවේදයක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවද එවැනි ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පුහුණු වැඩමුළු සඳහා නිලධාරීන් තෝරා ගැනීම සඳහා කමිටුවක් පත්කර එම කමිටු නිර්දේශ මත නිලධාරීන් තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | පුහුණුවීම සඳහා සියළුම නිලධාරීන්ට අවස්ථාව සැලසෙන ක්‍රමවේදයක් සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යවසායකයින් 2000 ක් නව අපනයනකරුවන් බවට පත්කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2017 සිට 2019 දක්වා රු.34,116,691 ක් වැයකර තිබුණි. මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පාලන කමිටුවක් පත්කල යුතු බව 2017 මාර්තු 30 දිනැති අංක 2017/03/20 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් දක්වා තිබුණද එසේ කර නොතිබුණි. තවද මෙම වැඩ සටහන් පැවැත්වීමට ස්ථාන තෝරා ගැනීමේදී රාජ්‍ය අංශයේ ආයතනවලින් මිල ගණන් කැඳවීමකින් තොරව පෞද්ගලික අංශයේ ආයතනවලින් මිල ගණන් කැඳවා රු.3,473,425 ක් වැය කරමින් පෞද්ගලික හෝටල් 06ක වැඩසටහන් පවත්වා තිබුණි. මාතර පැවැත්වූ වැඩසටහන සඳහා ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සිදු නොකිරීමෙන් ආහාර, නවාතැන් හා ප්‍රදර්ශන කුටි සඳහා රු.299,500 කද කුරුණෑගල පැවැත්වූ වැඩසටහනේදී ආහාර සඳහා රු.57,900 කද අනාර්ථික වියදම් දරා තිබුණි. මෙහිදී ඇස්තමේන්තු පිරිවැය ඉක්මවා රු.215,900 ක් වැයකර තිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. මෙම වැඩ සටහනින් ව්‍යවසායකයින් 2000 ක් අපනයනයට යොමු කිරීමට අපේක්ෂා කලද, 2017- 2019 කාලය තුළ 155 දෙනෙකු පමණක් අපනයනයට යොමුවී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | වැඩ සටහනින් අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි පාලන කමිටුවක් පත්කර විධිමත් සැලැස්මකට අනුව විදේශ වෙළඳපල තරඟකාරිත්වයට මුහුණදිය හැකි සුදුසු තත්වයට ව්‍යවසායකයන් පත්කිරීමට මණ්ඩලය සහය විය යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය 257 ක් වුවත් සත්‍ය කාර්යමණ්ඩලය 228 ක් වූයෙන් තනතුරු 29 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්ද කනිෂ්ඨ මට්ටමේ තනතුරු 9 ක්ද පහළ | 2019 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය තුල පුරප්පාඩු වී පවතින අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) හා අතිරේක | මන්ඩලයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමට අදාළවන තනතුරු සඳහා කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

මට්ටමේ තනතුරු 8 ක්ද පුරප්පාඩුව පැවතිණි. මෙම පුරප්පාඩු අතර මණ්ඩලයේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට සෘජුවම අදාළවන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංවර්ධන), අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) වැනි තනතුරුද පැවතිණි.

අධ්‍යක්ෂ ජනරාල් (මුදල් හා පාලන) යන තනතුරු දෙක සඳහා 2019.09.16 (ඉංග්‍රීසි) හා 2019.09.17 (සිංහල හා දෙමළ) පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා එම තනතුරු දෙක සඳහා මැතිවරණ නීති උල්ලංඝණය නොවන සේ පත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. එසේ වුවත් ඉහත තනතුර සඳහා අයදුම්පත් යොමු කරන ලද අයදුම්කරුවන්ගේ පළපුරුද්ද පිළිබඳව ඇති වූ ව්‍යාකූලත්වය සම්බන්ධව කටයුතු කිරීමට සිදු වූ බැවින් සැලසුම් කළ පරිදි එම පත්වීම් සිදු කිරීමට නොහැකි විය. එබැවින් අපගේ EDB/HRM/FI/REC/08-2 හා 2020.03.20 දිනැති ලිපිය මගින් මෙම තනතුරු දෙකද ඇතුලත්ව තනතුරු 7 ක් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වා එහි ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ නමුත් මෙම තනතුරු දෙක සඳහා අනුමැතිය ලැබී නොමැත. මේ සඳහා අපගේ අංක EDB/HRM/FI/REC/08-1 හා 2020.07.01 දින නැවත මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ලිපියක් යොමු කරන ලදී.

පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) හා අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා උපාය මාර්ගික සැලසුම්) යන තනතුරු දෙක සඳහා 2020.06.25 වන දින සිට නව නිලධාරීනියන් දෙදෙනෙකු පත් කර ඇත.

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන වර්ග අඩි 44990 වන DHPL ගොඩනැගිල්ල සඳහා වර්ග අඩියකට රු.1,500 බැගින් වාර්ෂික කුලිය වශයෙන් රු.මිලියන 67.48 ක් ගෙවීමට සිදුවීමත් භාණ්ඩාගාරයෙන් ඒ සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමෙන් වාර්ෂිකව ඇතිවන හිඟ ගොඩනැගිලි කුලිය අවම කර ගැනීමේ හා ඉඩකඩ උපරිමව භාවිතා කිරීමේ අරමුණින් මණ්ඩලය විසින් මහල් 5 ක පවත්වාගෙන යන කාර්යාලය මහල් 4 ක් දක්වා අඩුකර නැවත ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය 2017 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත්, ඒ සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව තෝරාගත් ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය විසින් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රු. මිලියන 102.5ක මූල්‍ය හා තාක්ෂණික වාර්තා පිළියෙල කිරීම වෙනුවෙන් රු.175,950 ක ගාස්තුවක් අයකර තිබුණි. තවද ලංසු කැඳවීමේ ක්‍රියාවලියට ආරාධනා කිරීමේ පුවත්පත් දැන්වීම සඳහා රු.56,890 ක් ගෙවා තිබුණි.ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කර නොමැති බැවින් මෙම වියදම ආනර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය වේ. | කාර්යාලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කරන ලද අංක 179/08/2018දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් හිටපු සභාපතිනිය විසින් ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ සහය ලබාගන්නා බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වා ඇත. ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද දළ ඇස්තමේන්තුවට අනුව ප්‍රතිව්‍යුහගත කිරීමේ මුළු පිරිවැය රු .මිලියන 102.5ක් වේ .ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ප්‍රතිපාදනය රු .මිලියන 20ක් පමණක් බැවින් එම කාර්යය නතර කිරීමට සිදුවිය .මේ සඳහා 2019ක්‍රියාකාරි සැළැස්මේ සහ අයවැය ලේඛනය තුළ ප්‍රතිපාදන සලසා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර සහ පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර අවම පිරිවැයකින් ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කළ යුතුය. |